## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - 2016

-----------------------------------------------

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව දේපල පිරියත සහ උපකරණ අයිතම සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් වන සහ ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් ඒවා වාර්ෂිකවද එසේ සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන අයිතම වසර 3කට හෝ වසර 5කට වරක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රමාණවත් බව දක්වා ඇත. එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරිය සතුව පැවති වටිනාකම රු. 5,763,014,972 ක් වූ වත්කම්වල සාධාරණ අගය ගිණුම්ගත කිරීම සඳහා 2008 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉවත් කරන වත්කම්වල පිරිවැය අදාළ වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වුවද, 2009 වර්ෂයෙන් පසු ඉවත් කරන ලද වත්කම්වල වටිනාකම්, අදාල වත්කම් ගිණුම්වලින් සහ ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. ඒ අනුව 2015 හා 2016 වර්ෂවලදී එලෙස ඉවත් කරන ලද වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනයෙහි ආරක්ෂක තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ 2016 වර්ෂයට අදාල එකතුව රු.1,097,195 ක් වූ ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මෝටර් රථ දෙකක් සඳහා සිදු කරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ අලුත්වැඩියාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද රු. 929,427 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියට අදාළ නවීකරණ වියදම් රු. 2,085,873 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ වියදම් 05 කට අදාළව අවලංගු කරන ලද චෙක්පත් 75 ක වටිනාකම වූ රු.173,635 ක් සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් වලින් අඩුකර දක්වා තිබුණි.

(ඉ) පෞද්ගලික දුරකථන සමාගමක් වෙත දුරකථන ගාස්තු ගෙවීමේදී 2014, 2015 හා 2016 වර්ෂයන් වෙනුවෙන් ලබා දී තිබූ රු. 1,818,537 ක වට්ටම් ආදායම් ලෙස ගිණුම්ගත නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් පුහුණු මධ්‍යස්ථාන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත් 06 ක් වෙනුවෙන් ගෙවා තිබූ රු. 29,581,369 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් කර තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 39,748,214 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු පාඨමාලා ගාස්තු රු. 19,458,199 ක් වූ අතර එයින් රු. 2,204,788 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. ඉතිරි රු. 17,253,411 කින් රු .10,277,809 ක් 2017 දෙසැම්බර් 10 වන විටත් අයනොවී පැවතුණි.

(ආ) වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් වර්ෂ 16 ක සහ වර්ෂ 11 ක සිට අයකර ගත යුතු පිළිවෙලින් රු. 3,930,931 ක් හා රු. 131,043 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් රජයේ ආයතන 11 කින් වර්ෂ 11 කට වැඩි කාලයක සිට අයකර ගත යුතු රු. 2,844,106 ක ශේෂය තුළ දැනට වසා දමා ඇති ලක්සල ආයතනයෙන් අයකරගත යුතුව පවතින රු. 1,437,200 ක ශේෂයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද දීර්ඝ කාලයක සිට අයවීමට ඇති මෙවැනි ශේෂ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු පියවරක් නොගෙන වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂවල එකතුව රු. 130,578,519 ක් වූ අතර ඉන් රු. 10,080,342 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට ද, රු. 4,854,746 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් සහ රු. 35,963,225 ක් වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක සිටද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර එම ශේෂ පියවීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීතී රීතී සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) VIII වැනි පරිච්ඡේදයේ 4.1 ඡේදය | අධිකාරිය විසින් තෘතියීය මට්ටමේ සිටින මාණ්ඩලික නිලධාරීන් 21 දෙනෙකුට රු. 885,361 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ii) IX පරිච්ඡේදයේ 2.2 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී රු. 10,930,695 ක අර්ධකාලීන පුහුණු උපදේශක ගාස්තු ගෙවා තිබූ අතර ඒ සඳහා අයකර ගත යුතු සියයට 10 රාජ්‍ය භාගය රු. 1,093,069 ක් වුවත් අධිකාරිය විසින් වර්ෂය තුළ රු. 594,733 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අනුව රු. 498,336 ක රාජ්‍ය භාගය අයකර නොතිබූ අතර සියලු අර්ධකාලීන පාඨමාලා උපදේශක ගාස්තු මත රාජ්‍ය භාගය අය කරන බවට තහවුරු කරගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | රත්මලාන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක දෘඩාංග පාඨමාලාවට අයත් පරිගණක යන්ත්‍ර 02 ක් 2015 ජනවාරි 15 දින අස්ථානගතව තිබූ අතර සිදුවූ පාඩු හා හානි පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි |
| (iii) මුදල් රෙගුලාසි 188 (2) | 2009 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කරන ලද රු. 49,644 ක් වූ චෙක්පත් 2 ක් 2016 දෙසැම්බර් 31 වනවිටත් උපලබ්ධි වී නොතිබිය දී ඒ පිළිබඳ පසුවිපරම් සිදුකර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 වැඩි කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් 30 දෙනෙකුට ගෙවිය යුතු රු. 4,980,200 ක රඳවා ගැනීම් මුදල් හා රු. 584,996 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | 9.3.1 ( vii) ඡේදය | යම් හේතුවක් මත වැඩ බැලීමේ පත්වීම් සිදු කළද එය මාස 03 ක් ඉක්මවා ලබා නොදිය යුතු වුවත්, ඊට පටහැනිව වර්ෂ 03 දක්වා වැඩ බැලීමේ පත්වීම් මත රාජකාරී ආවරණ කළ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය. |
| (ඉ) | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනි ලෙස අධිකාරියේ සේවයේ නියුතු සේවකයන්ගේ පෞද්ගලික දුරකථන බිල්පත් සේවකයන්ගේ වැටුපෙන් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත පාලක මණ්ඩල අනුමැතිය අනුව අධිකාරිය විසින් මාසිකව රු. 353,853 ක සාමාන්‍ය මුදලක් දුරකථන වෙනුවෙන් වැය කර දින 12 කට පසුව වැටුපෙන් ප්‍රතිපූර්ණ කර ගෙන තිබුණි. |

## 2.5. ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

---

රක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ආධුනිකයන්ගෙන් රු. 500 බැගින් එකතු කර රු.38,354,000 ක් අධිකාරියේ බැංකු ගිණුමක තැන්පත්කර වර්ෂය තුළ ඉන් රු.500,000 ක් පමණ වන්දි ලෙස ගෙවා තිබුණද 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 33,280,068 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 75,332,249 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 108,612,317 ක වර්ධනයක් ඇති වී තිබුණි. පුනරාවර්තන වැය සඳහා වූ භාණ්ඩාගාර ප්‍රදාන රු. 124,473,000 කින් හා වෙනත් ආදායම් රු. 16,898,073 කින් වැඩිවීම සහ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ වියදම් රු. 5,763,323 කින් හා රැකියාගත කිරීම්, පර්යේෂණ හා ව්‍යවසායකත්ව වියදම් රු. 4,060,356 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

ප්‍රවර්තන වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2016 වර්ෂවල මූල්‍ය අතිරික්තයන්ද ඉතිරි වර්ෂවල ඌනතාවයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ දායකත්වය 2012 සිට 2016 වර්ෂය දක්වා පිළිවෙලින් රු. 1,144,087,661 ක්, රු. 1,023,595,450 ක්, රු. 1,059,237,421 ක්, රු. 1,338,404,900 ක් හා රු. 1,460,306,994 ක් විය. ඒ අනුව 2013 වර්ෂයේ සිට ආයතනයේ දායකත්වය අඛණ්ඩව වැඩිවීමක් පෙන්නුම් කරයි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල පාඨමාලා ගාස්තු ආදායම රු. 131,818,200 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ආදායම් ගණනය කිරීමේදී නිශ්චිතව හඳුනාගත හැකිව තිබූ පාඨමාලා ගාස්තු නිදහස් කිරීම හා අනුමත ආධුනික හැරයාම් එකතුව රු. 7,861,839 ක් ආදායම් ලෙස හඳුනාගෙන පසුව වෙනත් මෙහෙයුම් වියදම් ලෙස ලියාහැර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1 කාර්යසාධනය**

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත අනුව, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සේවා නියුක්තිය සඳහා පුහුණුවක් ලබා දීම, ජාතික ශිල්පීය පරීක්ෂණ හා විභාග පැවැත්වීම හා සහතිකපත් නිකුත් කිරීම, වෘත්තීය පුහුණු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා සංවර්ධනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු කටයුතු සම්බන්ධිකරණය කිරීම, පහසු කිරීම හා ඒවාට සහාය වීම, මාර්ගෝපදේශනය හා උපදේශනය, රැකියාගත කිරීම, ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය ජාතික හා ජාත්‍යන්තර පුහුණු සංවිධාන හා ආයතන සමඟ සබඳතා පවත්වාගෙන යාම සහ වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය පුද්ගලයන් පුහුණු කිරීම, සම්බන්ධිකරණය හා පහසු කිරීම යන කාර්යයන් ආයතනයේ ප්‍රධාන අරමුණු විය.
අධිකාරිය විසින් වර්ෂ කිහිපයක සිට ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ පර්යේෂණ පවත්වා නොතිබුණු අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සඳහා ද අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ක්ෂේත්‍ර 18 කට අයත් වූ පුහුණු පාඨමාලා 133 ක පුහුණු වැඩසටහන් 2,584 ක් සඳහා ආධුනිකයන් 35,460 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ අතර ඒ යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් 1,952 ක් සඳහා ආධුනිකයන් 31,537 දෙනෙකු එනම් ඉලක්ක කළ ප්‍රමාණයෙන් සියයට 88 ක් බඳවාගෙන තිබුණි. එයින් අර්ධ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් 4,700 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද ආධුනිකයින් 1,833 ක් පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අර්ධකාලීන පාඨමාලා සඳහා බඳවාගැනීම් ඉලක්කයෙන් සියයට 39 ක් පමණක් ඉටුකර තිබුණි.

(ii) මූලික වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයක් නොවන තොරතුරු තාක්ෂණ සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් වැඩි අවධානයක් යොමුකර තිබූ අතර මූලික වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම් කෙරෙහි අඩු අවධානයක් යොමු කර තිබුණි.

(iii) තොරතුරු තාක්ෂණ, සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණ (IT Sector) ක්ෂේත්‍රයට 2016 වර්ෂය සඳහා බඳවාගැනීම් වලින් සියයට 23 ක් එනම් 7439 ක් වූ වැඩිම බඳවා ගැනීම් කර තිබූ නමුත් වැඩිම රැකියාගත කිරීම් වූ 978 ක් විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රය සඳහා සිදුකර තිබුණි. ඒ අනුව රැකියා වෙළඳපොළ ඉලක්ක කර පුහුණු කටයුතු සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය.

(iv) 2016 වර්ෂය තුළ රැකියාගත කිරීම් අංශයේ ඉලක්කගත රැකියාගත කිරීම් ප්‍රමාණය 8,300 ක් වී තිබූ අතර සත්‍ය රැකියාගත කිරීම් 6,052 ක් එනම් සියයට 73 ක් වී තිබුණි.

(v) විදේශිය රැකියාගත කිරීම් ඉලක්කය සියයට 41 ක් වුවද සත්‍ය රැකියාගත කිරීම් සියයට 03 ක් පමණක් වී තිබීම නිසා විදේශීය රැකියා වෙළඳපොළ කෙරෙහි නැඹුරුතාවය අඩු බව නිරීක්ෂණය විය.

(vi) අධිකාරියෙන් පුහුණුව ලබා වාර්ෂිකව ඉවත්වන පුහුණුලාභීන් රැකියාගතවීම පිළිබඳ පසුවිපරමක් ආයතනය විසින් සිදු කර නොතිබුණු අතර ඒ පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**--------------------------------**

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිලධාරින් 8 දෙනෙකුගෙන් අයකරන ලද රු. 106,100 ක මුදල වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය නොකර ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු අරමුදල් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් පුහුණු කටයුතු සඳහා මිලදී ගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ පුහුණු උපකරණ ලෙස දක්වා තිබූ මෝටර් රථ 19 ක් අධිකාරියේ ධාවන කටයුතු සඳහා භාවිතා කර තිබුණි. තවද අධිකාරිය විසින් භාවිතා කරන ලද ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති මෝටර් රථ 22 ක් පුහුණු කටයුතු සඳහා ලබාදී තිබූ අතර පුහුණු කටයුතු සඳහා ලබා දීමට පෙර එම වාහනවල ලියාපදිංචි අංක මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හරහා අවලංගු කරවාගෙන නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂාවේදී හඳුනාගත් අඩුපාඩු පහත දැක්වේ.

(i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව ජාතික වෘත්තීය මට්ටම් සහතික (NVQ) ලබා දෙන සියළු පාඨමාලාවල, පාඨමාලා ප්‍රතීතන කටයුතු (accreditation) වසර 03 කට වරක් සිදුකළ යුතු වුවත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල පවත්වාගෙන යන පාඨමාලා 03 ක ප්‍රතීතනය කළ යුතු කාලපරිච්ඡේදය මාස 06 ක් ඉක්මවා තිබුණද අවශ්‍ය ප්‍රතීතනය 2017 දෙසැම්බර් 12 දින වන විටත් කර නොතිබුණි.

(ii) පුල්මුඩේ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික ශිල්පී පාඨමාලාව (වසර 1 ක) 2016 අගෝස්තු 08 දින ආරම්භකර තිබුණද ඒ සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය විගණිත දිනය වූ 2017 පෙබරවාරි 01 දින වන විටත් ලබා දී නොතිබුණි.

(iii) ත්‍රිකුණාමල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හා ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා පහසුකම් පරීක්ෂාවේදී විදුලි පහසුකම්, ප්‍රමාණවත් පුටු සංඛ්‍යාවක් සහ ප්‍රමාණවත් පරිගණක සපයා නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(iv) නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පුහුණු මධ්‍යස්ථාන 03 ක පාඨමාලා හදාරන දමිළ මාධ්‍ය ආධුනිකයන්ට 2017 ප්‍රථම අර්ධ වර්ෂය සඳහා දෛනික පුහුණු වාර්තා පොත් 2017 පෙබරවාරි 01 දින වන විටත් ලබාදී නොතිබුණු අතර මධ්‍යස්ථාන 02 ක විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව හදාරන දමිළ ආධුනිකයන් හට සිංහල දෛනික පොත් සහ ඡායා පිටපත් කළ දමිළ මාධ්‍ය පොත් ලබා දී තිබුණි.

(v) අග්බෝපුර ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ පාඨමාලාවට අයත් යූපීඑස් (UPS) 12 ක් අක්‍රීය වී තිබූ නිසා පරිගණක වල පැවැත්ම අනාරක්ෂිත වී තිබුණි.

(ඇ) ආපනශාලා පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරාගත යුතු වුවද 2011 වසරේ සිට 2017 සැප්තැම්බර් 30 දක්වාම නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම ප්‍රසම්පාදන විධිවිධාන වලට පටහැනිව එකම පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

------------------------------

ලෝක කම්කරු සංවිධානය මගින් වව්නියාව, මන්නාරම, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නගා සිටුවීම සඳහා 2016 වර්ෂය තුළ ලබා දී තිබූ රු. 20,271,540 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,355,755 ක් අධිකාරියේ නිලධාරීන් 31 දෙනෙකු අතර දීමනා ලෙස බෙදා දී තිබුණද ගෙවීමේ අවිධිමත්භාවය නිසා එය නැවත අයකර ගැනීමට සභාපතිවරයා විසින් තීරණය කර තිබුණි. 2017 ඔක්තෝබර් 31 දින වන විට ඉන් රු. 272,489 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි.

## 4.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු. 1,500,000 ක් වූ සහ 2016 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 150,169 ක් වූ බස්රථය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේද, පිරිවැය රු. 1,100,000 ක් වූ සහ 2016 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 110,124 ක් වූ තවත් බස්රථයක් වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අම්පාර නින්දවූර් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේද ගාල්කර තිබුණි.

(ආ) නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ අම්පාර හා ගාල්ල දිස්ත්‍රික්කයන්හි පාඨමාලා 12 කට අයත් පුහුණු උපකරණ අයිතම 1,849 ක් එම පාඨමාලා නොපවැත්වීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 පෙබරවාරි 02 දින කරන ලද නියැදි පරීක්ෂාවකදී සේරුවාවිල ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික උපකරණ කාර්මික ජලනල කාර්මික පාඨමාලාවන්ට අයත් පුහුණු උපකරණ හා වෙරුගල් පුහුණු මධ්‍යස්ථානයේ වෑද්දුම් ශිල්පීය පාඨමාලාවට අදාල උපකරණ උපදේශකවරුන් නොමැතිව පාඨමාලා නොපැවැත්වීම හේතුවෙන් නිශ්කාර්යව තිබුණි. 2017 ජූලි 31 දින වන විටත් එම පාඨමාලා ආරම්භ කිරීමට කිසිදු සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඈ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 හා 2016 යන වර්ෂ තුළ කුච්චවේලි සහ කරෙයිනගර් හෝටල් පාසල් සඳහා මිලදී ගෙන තිබූ රු. 10,481,619 ක් වටිනා පුහුණු උපකරණ එම මධ්‍යස්ථානවල ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් 2017 ජූලි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. සමහර පුහුණු උපකරණවල වගකීම් කාලය උපකරණ භාවිතයකින් තොරව අවසන්වී තිබූ අතර ඇතැම් උපකරණ මල බැඳීම, අවපැහැ ගැන්වීම් වලට ලක්ව තිබිණි.

(ඉ) (i) ආදර්ශ හෝටලයක් ලෙස පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ ඇගයීමකින් තොරව හෝටල් පුහුණු ක්ෂේත්‍රයට අදාල පාඨමාලා 04 ක් පවත්වාගෙන යන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ අහංගම පිහිටුවා තිබූ හෝටල් පාසල පිහිනුම් තටාකයක් සහිතව තරු 03 නේ මට්ටමේ හෝටලයක් ලෙස නවීකරණය කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය මත 2014 ඔක්තෝබර් 06 වන දින රු .110,355,000 ක වටිනාකමට දින 240 ක කාලයකින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(ii) තවද තරු තුනේ මට්ටමේ එම හෝටලයේ සුඛෝපභෝගී පහසුකම් සහිත හෝටලයක් ලෙස තව දුරටත් වෙනස්කම් සිදුකිරීමට 2016 අප්‍රේල් 29 දින රු. 12,362,223 ක් වූ අමතර ඇස්තමේන්තුවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. 2017 ජුනි 30 දින වන විට මෙම ඉදිකිරීම සඳහා රු. 1,011,801,679 ක් වැයකර තිබූ නමුත් වරින් වර සැලසුම් වෙනස්කිරීම හා කොන්ත්‍රාත් කරුගේ අඩුපාඩු නිසා 2017 ජුනි 30 දක්වා ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. කෙසේ වුවද තරු තුනේ මට්ටමේ හෝටලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් අධිකාරිය සතුව නොමැති නිසා එය රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට පෞද්ගලික අංශයේ ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා 2017 මාර්තු 22 දින පුවත්පත් නිවේදනයක් මඟින් ලංසු කැඳවා තිබුණි.

(iii) ප්‍රමුඛතාවය ලබා දිය යුතු ඉදිකිරීම් පිළිබඳව නිවැරදිව හඳුනා නොගෙන අහංගම හෝටල් පාසල ආදර්ශ හෝටලයක් ලෙස නවීකරණය කිරීම හේතුවෙන් අදාල හෝටල් පාසල වෙනත් ඉඩමක ඉදිකිරීම 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. හෝටල් පාසලේ ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා 2014 වර්ෂයේදී නවතා දමන ලද පාඨමාලා හතර 2017 වර්ෂය වන විටත් නැවත ආරම්භ කිරීමට නොහැකි වීමෙන් එම හෝටල් පාසලේ ප්‍රයෝජනය සඳහා 2015 හා 2016 වර්ෂවල මිලදී ගෙන තිබූ රු. 8,605,519 ක් වටිනා පුහුණු උපකරණ පුරා වසර දෙකකටත් වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි. අරමුදල් සපයා දී තිබූ ව්‍යාපෘතියේ හා අධිකාරියේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 4.6 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමකින් තොරව බැංකු ජංගම ගිණුම් 05 ක එකතුව රු. 331,133 ක මුදලක් රඳවා ගෙන තිබුණි.

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් 2011 වර්ෂයේ දී පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු. 9,815,342 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ව්‍යාපෘති අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

2016 වර්ෂය තුළ පුහුණු උපකරණ මිලදී ගැනීම පිළිබඳ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී තාක්ෂණික ඇගයීම් කමිටු විසින් අවස්ථා 10 කදී අවම මිල ලංසු ඉදිරිපත් කළ ප්‍රසම්පාදන පිළිනොගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ හේතූන් පිළිගත නොහැකි වූ අතර ඒ සඳහා වූ වැඩි මිල ලංසු පිළිගැනීම නිසා එම මිලදී ගැනීම් වෙනුවෙන් රු. 3,220,900 ක් වැඩිපුර ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්**

-------------------------------------------------------------------

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත අධිකාරියේ නිලධාරීන් තුන්දෙනෙක් හා ඊට අයත් වාහන දෙකක් ලබා දී තිබූ අතර ඊට අමතරව නිපුණතා ආංශික ව්‍යාපෘතිය වෙත එක් නිලධාරියෙක් නිදහස් කර තිබුණි. ඒ වෙනුවෙන් අධිකාරිය වර්ෂය තුළ වැටුප් හා දීමනා ලෙස රු. 1,477,596 ක වියදමක් දරා තිබුණි.

**4.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර 2015 අප්‍රේල් 30 දින සිට පුරප්පාඩුව පැවති අතර 2015 මැයි 05 දින සිට මෙම තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පත්කර තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය කෙරෙහි විගණනයේදී ගැටළුකාරී විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 2,361 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1,814 ක් වූයෙන් පුරප්පාඩු 547 ක් වී තිබුණි. පුරප්පාඩු තනතුරු වලින් 269 ක් උපදේශකවරුන් වීම නිසා ඉලක්ක කරන ලද පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඇ) අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව කොන්ත්‍රාත් පදනමින් උපදේශකවරුන් බඳවා ගැනීමට ප්‍රතිපාදන සලසා නොතිබියදී සුදුසුකම් සම්පූර්ණ නොකළ උපදේශකවරුන් දිගින් දිගටම කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන පසුව කොන්ත්‍රාත් කාලය පරිවාස කාලය ලෙස සලකා සුදුසුකම් නොමැතිව තනතුරෙහි ස්ථිර කර තිබුණි. එලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන වර්ෂ 03 කට වැඩි සේවා කාලයක් සහිත උපදේශක නිලධාරීන් 80 දෙනෙකු 2017 ජනවාරි මාසයේදී උපදේශකවරුන් ලෙස ස්ථිර කර තිබුණි.

(ඈ) අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ 5.1.1 වගන්තිය අනුව උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේදී ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක් යටතට අයත් තාක්ෂණ විද්‍යා පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු වුවත් 2014 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකවරුන් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී බඳවා ගත් උපදේශකවරු 91 දෙනාගෙන් 23 දෙනෙකුම එම සුදුසුකම සපුරා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා බඳවා ගැනීමේදී බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2.6 වගන්තිය ප්‍රකාරව නියමිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් නියම කර ඇති ලකුණු දීමේ ක්‍රමවේදයට අනුව සිදුකළ යුතු වුවද එයට පටහැනිව 2015 ජුනි 05 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 08 දෙනෙකුගේ අත්සන් සහිත ලිපියකට අනුව එම තනතුර සඳහා 2015 අප්‍රේල් 22 දින සිට අවිධිමත්ව නිලධාරියෙකු පත්කර තිබුණි.

(ඊ) ආයතනයේ මාධ්‍ය පුහුණු පාඨමාලාවක් ක්‍රියාත්මක කර නොතිබියදී 2011 වර්ෂයේදී එම ක්ෂේත්‍රය සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ නොකළ උපදේශකවරියක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණද ඇය උපදේශකවරයකුගේ කාර්යභාරය ඉටුකර නොතිබියදී දිගින් දිගටම ඇයට සේවා දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. පසුව අධිකාරියෙන්ම ලබා ගන්නා ලද පුහුණුව මත 2014 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උපදේශකවරියක ලෙස නැවත කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. නිලධාරිනිය එම ක්ෂේත්‍රයේද කාර්යභාරයන් විධිමත්ව ඉටුකර නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(උ) 2013 දෙසැම්බර් 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩල තොරතුරු අනුව එක් එක් නිළධාරියාට පෞද්ගලික වනසේ ඇතිකරන ලද (MA 1-2) වැටුප් පරිමාණය යටතේ මූලික සුදුසුකම් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකවරුන් ස්ථිර කරමින් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණය තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුණි.

**4.10 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මායිම් තාප්පය ඉදිකිරීම සඳහා වටිනාකම රු. 1,781,424 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමක් 2016 ජුලි 29 වන දින ඇති කර ගෙන තිබූ අතර ගිවිසුම හා ඉදිකිරීම් ප්‍රමාණ පත්‍රය අනුව භූමිය සකස් කිරීම සඳහා පස් කියුබ් 14 ක් පිරවීම වෙනුවට ABC කියුබ් 16.16 ක් පිරවීම, තාක්ෂණික ඇගයීම් කමිටුව 2016 දෙසැම්බර් 26 දින නිර්දේශ කර තිබුණි. ඉදිකිරීම් අධීක්ෂණය කරන ලද කාර්මික නිළධාරී විසින් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු. 1,280,146 ක අවසන් බිල්පත්‍රය සහතික කර තිබුණද එම ගෙවීම අත්හිටුවා ආයතනය විසින් ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් භූමිය සකස් කිරීම පිළිබඳ ලබාගත් වාර්තාව අනුව ABC යෙදීම වෙනුවට ගඩොල් හා ගල් කැට යොදා භූමිය සකස්කර තිබුණ බව තහවුර කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) **(i)** ත්‍රිකුණාමලය කුච්චවේලි හෝටල් පාසල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව දින 365 කින් අවසන් කිරීම සඳහා 2014 දෙසැම්බර් 23 වන දින කොන්ත්‍රාත් වටිනාකම රු 169,164,622 ක ගිවිසුමට එළඹ තිබුණි. එහෙත් 2017 පෙබරවාරි 03 වන දිනට ඒ සඳහා දින 772 ක් ගතවී තිබුණද එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) විගණන දිනය වූ 2017 සැප්තැම්බර් 29 දින වන විටත් එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය අධිකාරිය විසින් පවරාගෙන නොතිබුණි. තවද උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේදී දිස්ත්‍රික් මිනින්දෝරු විසින් සලකුණු කළ ඉඩමෙන් පිටත පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයට අයත් භූමියක කොටසක්ද ඇතුළත් වන පරිදි ඉදිකිරීම් සිදුකර ගෙන යන බව භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) ඉඩමේ මූලික පස් හා භූගත ජල පරීක්ෂාවක් සිදුකර මොරටුව විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්යවරයෙකු විසින් පිහිටි පොළව මත මීටරයක් උසට පස් පුරවා ඉදිකිරීම් කිරීමට ලබාදී තිබූ උපදෙස් පදනම් කරගෙන පස් ඝන මීටර් 11,500 ක් යොදා භූමිය පිරවීම සඳහා ඝන මීටරයකට රු. 1,100 බැගින් රු. 12,650,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හෝ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නොමැතිව ඉදිකිරීම් භූමියේ පස් පිරවීම වෙනුවට මූල පාෂාණය ඉවත් කර ඝණ මීටර් 636.34 ක ගල් කැඩීම සිදුකර තිබුණ බව 2017 පෙබරවාරි 17 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඒ වෙනුවෙන් රු.7,884,253 ක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවා තිබුණි.

(v) පහත් බිමක ඉදිකිරීම් සිදු කිරීම නිසා පහසුවෙන් ගං වතුර ආපදාවන්ට ලක්විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) (i) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට වැඩහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දින 150 කින් නිම කිරීමට පෞද්ගලික සමාගමක් සමඟ රු. 42,613,557 ක වටිනාකමට 2013 ඔක්තෝබර් 07 දින, කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබූ අතර කල් දිගු කිරීම් 02 ක් සහිතව 2014 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත් එදිනට වැඩ අවසන් කර නොතිබීම මත අධිකාරිය විසින් 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හිටුවා තිබූ අතර එම තීරණයට එකඟ නොවූ කොන්ත්‍රාත්කාර සමාගම සමථකරණ මණ්ඩලයක් වෙත මෙම සිද්ධිය යොමු කර තිබුණි. 2017 ජූනි 30 දක්වා මෙම ආරාවුල අවසන් කර නොතිබුණි.

(ii) කෙසේ වුවද ඉදිකිරීම් කාර්යය අත්හිටුවීමෙන් පසු අධිකාරිය විසින් පත්කරන ලද උපදේශන ආයතනයක උපදෙස් පරිදි අධිකාරිය විසින් 2015 ඔක්තෝබර් 25 දින සකස් කර තිබූ වාර්තාව අනුව, රු.21,765,110 ක් වූ කල වැඩ වටිනාකමින් (වැට් සහිත) රු16,957,562 ක් වූ බිල්පත් ගෙවීම් හා වැඩ පූර්ව අත්තිකාරම්ද ගිවිසුම අනුව ඉතිරි වැඩ සඳහා සියයට 25 ක අධිභාර රු. 6,022,991 ක් ,ප්‍රමාද ගාස්තු හා අනෙකුත් අයකිරීම් රු. 2,603,557 ක් ඇතුළුව එකතුව රු25,584,110.ක අඩුකිරීම් කල පසු කොන්ත්‍රාත් සමාගමෙන් රු. 3,819,000 ක මුදලක් ආපසු අයකර ගත යුතුව තිබුණි.

(iii) ඉදිකිරීම් කාර්යය නිම කිරීම සඳහා 2016 අප්‍රේල් 08 දින නැවත ලංසු කැඳවා තිබුණද ඉදිකිරීම් කළ මුල් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොතිබීම හේතුවෙන් දෙවන වරට කැඳවූ ලංසු කැඳවීමේ ඇගයීම් කටයුතු 2016 ඔක්තෝබර් 27 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් අත්හිටුවීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් වැඩ වසර දෙකකට වැඩි කාලයක සිට ප්‍රමාද වී තිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ 2016 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2014 – 2018 වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැළැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව අධිකාරිය විසින් වර්ෂය තුළ වැඩසටහන් 99 ක් සඳහා ආධුනිකයින් 1,285 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මකවී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් සැලසුම් කර නොතිබූ වැඩසටහන් 12 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඒ සඳහා ආධුනිකයින් 294 ක් බඳවාගෙන තිබුණි.

**5.4** **අභ්‍යන්තර විගණනය**

-------------------------

2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009(i) හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නිළධාරීන් 12 දෙනෙකු අනුයුක්ත කර තිබුණද විගණන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කටයුතු හා 2012 – 2016 සංයුක්ත සැලැස්මෙහි සඳහන් අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් අවධානය යොමුකර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**5.5** **නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

මාගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත ඌනතාවයන් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(අ) 2003 වර්ෂයේදී අනතුරට ලක්වූ කැබ් රථයක් සම්බන්ධයෙන් ඊට වර්ෂ 06 කට පසුව 2009 පෙබරවාරි මාසයේදී පත්කරන ලද පරීක්ෂණ කමිටු නිර්දේශයට අනුව අනතුරෙන් වූ රු. 421,000 ක් වූ අලාභය අයකර ගැනීමට 2017 ඔක්තෝබර් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් තම නිත්‍ය තනතුරට අමතරව 2006 ජනවාරි 17 දින සිට 2014 වර්ෂය දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලන මණ්ඩලයේ සාමාජික හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් එම අරමුදලින් රු. 5,444,015 ක් ලබා ගෙන තිබීම සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 12 දින පැවති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභා අවස්ථාවේදී ජනාධිපති ලේකම් විමසා උපදෙස් ලබා ගන්නා ලෙස ලේකම්වරයාට නියෝග කර තිබූ නමුත් ඒ සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව සුදුසුකම් හෝ පලපුරුද්ද සම්පූර්ණ කර නොතිබුණු අධ්‍යක්ෂ ජනරාල්, තනතුරද ඇතුළු විධායක මට්ටමේ තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණි. ඊට අමතරව අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා ද නිලධාරියකු බඳවාගෙන තිබුණි. එම පත්කිරීම් සම්බන්ධව හිටපු විනිසුරුවරයකු මගින් 2015 වර්ෂයේදී විමර්ශනයක් කර නිකුත් කරන ලද වාර්තාවෙන් කරන ලද නිර්දේශයන් 2017 දෙසැම්බර් 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී ලෝක සංචාරක දිනය සැමරීම වෙනුවෙන් සැලසිනේ ආයතනයට ගෙවීම සඳහා 2012 පෙබරවාරි මාසයේ දී රු. 7,500,000 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනයෙන් ලැබී තිබුණි. අදාළ ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉන් ඉතිරි වූ රු. 1,000,000 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ දී අධිකාරියේ ආදායමට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය අක්‍රමිකතා මත වැඩ තහනම් කර නඩු පවරා තිබූ නිලධාරියෙකුට අනුමැතියකින් තොරව 2008 වර්ෂයේදී වැටුප් වශයෙන් රු. 1,711,961 ක් ගෙවා තිබූ අතර මෙසේ නොසැලකිලිමත්ව ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය වන තෙක්ම ගෙන නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී මිලදී ගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු. 1,875,747 ක මුදල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩුකම් හේතු කරගෙන ඇතිව තිබූ මතභේදාත්මක තත්ත්වය මත වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 78 සිට සියයට 1,363 දක්වා විචලතාවන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | - | බඳවා ගැනීමේ අවම සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවා ගෙන තිබීම. |
| | | - | සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල විධිමත්ව ක්‍රියාත්මක නොවීම. |
| | | - | විධිමත් ස්ථානමාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම |
| (ආ) | වත්කම් පාලනය | - | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම. |
| | | - | වත්කම් හඳුනා ගැනීමේ කේත භාවිතා නොකිරීම |
| | | - | නිෂ්කාර්ය වත්කම් පැවතීම |
| | | - | සියළු වත්කම් ඉන්වෙන්ට්‍රිගතව පැවතීම තහවුරු නොවීම හා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම. |
| | | - | අපහරණය කරන ලද වත්කම්, වත්කම් ලේඛන වලින් ඉවත් කර නොතිබීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | - | ආධුනික දීමනාව ලැබුණු බවට ආධුනිකයාගෙන් තහවුරුවක් ලබා නොගැනීම |
| | | - | දීමනාව ගණනය කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් තිබීම. |
| | | - | පාඨමාලා ගාස්තු බැංකුගත නොකර, උපදේශකවරුන්ට මුදලින් ලබා ගැනීමට අවසර ලබා තිබීම. |
| | | - | සියළු අර්ධකාලීන පාඨමාලා සඳහා රාජ්‍ය භාගය අයකරන බව තහවුරු කරගෙන නොතිබීම. |
| | | - | රාජ්‍ය භාගය වෙනම ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබීම. |
| (ඉ) | මූල්‍ය පාලනය | - | අභ්‍යන්තර පාලනයන් ඇති වන පරිදි කාර්යභාරයන් නිලධාරින් අතර කාර්යභාරයන් බෙදා දී නොතිබීම. |
| | | - | අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම |